**කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2010**

**-------------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන.**

-----------------

**1.1 මතය.**

-------

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම්.**

**------------------------------------------**

**1.2.1 ගිණුම්කරණ ප්‍රමිත.**

------------------------

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) රජයේ ප්‍රදාන මඟින් 2005 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් 31 දක්වා මිලදී ගෙන තිබූ එකතු වටිනාකම රු.44,775,893 ක් වටිනා ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 ට අනුකූලව වාර්ෂික ක්ෂය ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් විලම්භිත ආදායමක් ලෙස මූල්‍ය වාර්තාවල හඳුනාගෙන රජයේ ප්‍රදාන ගිණුමට හර කර නොතිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට මුළු පිරිවැය රු.64,561,516 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 09 කට අදාළ ක්ෂය අඩු කළ පසු වටිනාකම ශුන්‍ය වී තිබුණ නමුත්, එම ස්ථාවර වත්කම් නොකඩවා ප්‍රයෝජනයට ගනු ලබන හෙයින්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 අනුව ප්‍රත්‍යාගණනය කර එම වටිනාකම් ගිණුම්වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 සහ 1995 ඔක්තෝබර් 05 දිනැති අංක 649 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය පරිදි වත්කමක් එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය තුල ක්ෂය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුල මිලදී ගන්නා ලද වටිනාකම රු.4,226,665 ක් වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් ඒ පරිදි ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු.

-------------------------

පහත සඳහන් කරුණු අනාවරණය විය.

(අ) පහත සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් ගිණුම් වල සමාලෝචිත වර්ෂයේදී අඩුවෙන් හා වැඩියෙන් දැක්වීම් පිළිවෙලින් රු. 1,278,168 ක් සහ රු. 3,736,702 ක් විය.

| ගිණුම | වැඩියෙන් දැක්වීම | අඩුවෙන් දැක්වීම |
|---|---|---|
| | රු. | රු. |
| දේපළ පිරියත හා උපකරණ (ගොඩනැගිලි) | 2,658,180 | - |
| පාරිතෝෂික වෙන් කිරීම් | 319,732 | - |
| වාහන බලපත්‍ර සහ රක්ෂණ ගාස්තුව | 49,443 | - |
| වෙනත් ගිවිසුම්ගත සේවා | 21,103 | - |
| විදුලිය | 13,697 | - |
| වෙනත් පුනරාවර්තන වියදම් | - | 119,403 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 60,000 | - |
| පිරිසිදු කිරීමේ සේවා වියදම | - | 55,509 |
| ආරක්ෂක සේවා වියදම | - | 11,001 |
| ස්ථාවර වත්කම් | 216,092 | - |
| වෙනත් දීමනා | 6,500 | - |
| මුද්දර ගාස්තු | - | 5,625 |
| දුම්රිය බලපත්‍ර ගාස්තු | 9,460 | 4,290 |
| පුස්තකාල පොත් | - | 13,625 |
| දේපළ පිරියත හා උපකරණ (වාහන) | 339,277 | - |
| ක්ෂය | 43,218 | - |
| පොදු කාර්යය අරමුදල | - | 459,620 |
| දේපළ පිරියත හා උපකරණ | - | 609,095 |
| | 3,736,702 | 1,278,168 |

(ආ) භාණ්ඩ සමීක්ෂණ මගින් භාවිතයෙන් ඉවත් කිරීමට නිර්දේශ කර තිබු භාණ්ඩ ඒකක 167 ක වටිනාකම ස්ථාවර වත්කම් ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල පනතේ 99(1) වගන්තිය අනුව ආයතනය වෙත ලැබෙන සියලුම ලැබීම් ආයතනයේ අරමුදලට බැර කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබු රු.2,974,615 ක මුදලක් එසේ අරමුදල වෙත බැර කිරීමෙන් තොරව විවිධ අරමුදල් ගිණුම් 03 කට බැර කර ඉන් රු.2,352,659 ක මුදලක් වැය කර තිබුණි. එම ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් නොකර සමාලෝචිත වර්ෂය අවසානයට යථෝක්ත ගිණුම්වල වු ශේෂ පමණක් ශේෂ පත්‍රයේ වෙනත් ප්‍රදාන ලෙස දක්වා තිබුණි.

| අරමුදල | 2010.01.01 දිනට ශේෂය | ලැබීම් | වියදම් | 2010.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වාර්ෂික සම්මන්ත්‍රණ ගිණුම | 3,268,656 | 2,449,084 | 1,417,445 | 4,300,295 |
| ශිෂ්‍යත්ව ගිණුම | 7,174,411 | 318,996 | 228,200 | 7,265,207 |
| ප්‍රකාශන ගිණුම | 500,479 | 206,535 | 707,014 | - |
| | 10,943,546 | 2,974,615 | 2,352,659 | 11,565,502 |

(ඈ) 2010 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් නිර්දේශ කරන ලද භාවිතයට ගත නොහැකි රු. 3,150 ක් වටිනා භාණ්ඩ අයිතම 01 ක් , යල් පැනගිය වටිනාකම රු. 123,264 ක් වූ ශිෂ්‍ය අත්පොත් 1200 ක් සහ වටිනාකම රු. 92,500 ක් වූ ග්‍රන්ථ 260 ක් වශයෙන් එකතු වටිනාකම රු.218,914ක් තොග ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ආයතන විසින් පවත්වා ගෙන යනු ලබන පෞද්ගලික ජායාස්ථ පිටපත් ඒකකය වෙනුවෙන් 2009 නොවැම්බර් සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ගෙවියයුතු බිම් කුළිය ගණන් බලා, ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර,මූල්‍ය ප්‍රකාශනවල ඊට අදාළ ගැළපීම් ද සිදු කර නොතිබුණි.

(ඊ) කෙටිකාලීන පාඨමාලා පැවත්වීම වෙනුවෙන් දරන ලද රු.54,404 ක් සහ පොදු කාර්ය වියදම් වෙනුවෙන් දරන ලද රු.67,050 ක් ජර්නල් සටහන් අංක 109 න් වෙනත් පුනරාවර්තන හා පොදු කාර්ය වියදම් ගිණුම් වලට ගලපා තිබුණද, කෙටිකාලීන පාඨමාලා වියදම් ගිණුම් වලට ගැලපුම් කර නොතිබුණි.

(උ) 2009 වර්ෂයේ දි පර්යේෂණ කටයුතු වෙනුවෙන් පර්යේෂණ සම්බන්ධීකාරකවරයකුට ගෙවන ලද රු.75,000 ක උපදේශක ගාස්තු සහ රු.50,000 ක අත්තිකාරම් මුදල්, වලට අදාල කාර්යයන් සිදු නොකිරීම මත නැවත අය කර ගැනීමට තීරණය කර තිබුණු අතර අයවිය යුතු උපදේශක ගාස්තු රු.75,000 සඳහා ගැලපීම් කර නොතිබුණු අතර අත්තිකාරම් ආපසු පියවීමේදී මුදල් හර කොට අත්තිකාරම් ගිණුම බැර කල යුතු වුවත් , මුදල් ගිණුම හර කිරීම වෙනුවට ව්‍යාපෘති ගිණුම හර කර තිබුණි.

(ඌ) ආයතනයේ ශිෂ්‍යයකු සඳහා විදේශ ආයතනයකින් එවා තිබූ රු.400,284 ක ජීවන වියදම් දීමනා මුදලක් වර්ෂයේ වියදමක් ලෙස සලකා වෙනත් වියදම් යටතේද එම මුදල ආදායමක් ලෙසද ගිණුම්ගත කර තිබුණි.

### 1.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්.

මූල්‍ය ප්‍රකාශන අනුව 2000 වර්ෂයට පෙර සිට පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් අයවිය යුතුව තිබූ රු.166,131ක මුදලක්, නිසි පරිදි හඳුනා නොගෙන ආයතනය වෙත ගෙන්වා ගැනීමට කටයුතු කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ ලාභයට එරෙහිව කපාහැර තිබුණි.

### 1.2.4 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු අනාවරණය විය.

(අ) 1993 වර්ෂයේ සිට පැවත එන රු.5,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාද පියවා නොතිබුණි.

(ආ) පේරාදෙණිය ලංකා බැංකුවේ පවත්වාගෙන යන ජංගම ගිණුමෙහි 2003 සිට 2010 ජූලි දක්වා කාලයට අදාළ තැන්පත් කළ නමුත්, නිශ්කාෂණය නොවු රු.10,230 ක් වටිනා චෙක්පත් 06 ක් හා පේරාදෙණිය මහජන බැංකුවේ පවත්වාගෙන යන ජංගම ගිණුමෙහි 2010 අගෝස්තු මස බැංකු සැසඳුමේ සඳහන් තැන්පත් කළ නමුත්, නිශ්කාෂණය නොවු රු.6,240 ක් වටිනා චෙක්පත් 02 ක් සහ මුදල් ඇණවුම් 13 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 188 ප්‍රකාරව, කටයුතු කර නොතිබුණි.

(ඇ) 2010 ජනවාරි මස ගෙවන ලද රු.1,500 ක වැටුප් අත්තිකාරම් මුදලක් සහ ස්ථාන මාරු වී ගිය නිලධාරියකුගෙන් අය වියයුතු රු.10,580 ක ආපදා ණය ශේෂයක් 2011 මැයි වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත සඳහන් ගිණුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිවීම හේතුකොටගෙන විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| විෂයය | මුදල | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ස්ථාවර වත්කම් | 122,081,134 | ස්ථාවර වත්කම් ලේඛනය සහ උපලේඛන |
| විද්‍යා තැන්පතු | 4,710,982 | තැන්පතු ලේඛන |
| පුස්තකාල තැන්පතු | 8,879,849 | |
| ටෙන්ඩර් තැන්පතු | 139,795 | |

### 1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 45 වගන්තිය. | උපකුලපතිවරයාගේ අනුමැතියකින් තොරව මාසිකව රු.20,000 ක් බැගින් රු.120,000 ක මුදලක් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට ගෙවීම් කර තිබුණි. |
| (ආ) | **මුදල් රෙගුලාසි** | |
| | (i) 115 | ඉකුත් වර්ෂයට අදාල ගෙවීම් සඳහා අවස්ථා 06 කදී නිසි අධිකාරී බලය ලබා ගැනීමෙන් තොරව රු.169,450 ක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| | (ii) 135, 136, හා 137 | ආයතනයේ සේවය කරනු ලබන නිලධාරීන් 21 දෙනෙකුට වාර්ෂිකව මූල්‍ය බලතල පවරා නොතිබුණි. |
| | (iii) 371 | (i) තත්කාර්ය අතුරු අග්‍රීම වශයෙන් ලබා දිය හැකි උපරිම මුදල රු.20,000 ක් වුවත්, රු.25,000 සිට රු.95,200 ක් දක්වා අත්තිකාරම් ලබා දී තිබුණු අවස්ථා 10 ක් පැවති බව නිරීක්ෂණය විය.<br><br>(ii) තත්කාර්ය අතුරු අග්‍රීම නිශ්චිත කාර්යයන් සඳහා පමණක් ලබා දිය හැකි වුවද අවස්ථා 06 ක දී ලබා දුන් රු.33,987 ක මුදලක් දින 04 සිට දින 30 දක්වා අත රඳවා ගැනීමෙන් පසු පියවා තිබුණි. |
| | (iv) 756 | රු. 32,709,466 ක් වටිනා පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| | (v) 1645 | වාහන ලොග් සටහන් පොත් වල වාහන පිළිබඳ සියලු විස්තර දැක්වියයුතු වුව ද, වාහන 02 ක ලොග් සටහන් පොත්වල එම තොරතුරු ඇතුලත් කර නොතිබුණි. |
| | (vi) 1646 | ආයතනය සතු වාහන 04ක 2010 වර්ෂය දක්වාම දෛනික ධාවන සටහන් සමඟ මාසික සාරාංශ විගණකාධිපති වෙත එවා නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දින හා අංක අයිඑෆ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක යන්ත්‍ර වලට අදාලව ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | | 2006 ජනවාරි 25 දින හා අංක 10 දරන ප්‍රසම්පාදන නියෝජිතායතනයේ සභාපතිගේ චක්‍රලේඛයේ 5.4.12 ජේදය. | එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර විගණකාධිපති වෙත පිටපත් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතු වුව ද, අවස්ථා 12 කදී ගෙවන ලද රු.97,502 ක බදු මුදල් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV වන පරිච්ජේදයේ 8.1.2 වගන්තිය. | මෝටර් රථ සැතපුම් කුලි ලබා ගැනීමට පෙර ඒ සඳහා ආයතන ප්‍රධානියාගේ අනුමැතිය ලබා ගතයුතු වුව ද, අවස්ථා 20 ක දී ලබා ගත් රු.189,057 ක සැතපුම් කුලි සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| | (ii) | 28.6 ජේදය. | ගමන් වියදම් ඉල්ලුම් පත්‍ර අදාල ගමන නිමවී දින 30 ක් ඇතුළත ඉදිරිපත් නොකරන්නේ නම්, ඊට අදාල ප්‍රමාද ගාස්තු අය කර ගතයුතු වුව ද, අවස්ථා 13 කදී ඉදිරිපත් කරන ලද රු.155,995 ක ගමන් වියදම් ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් රු.19,311 ක ප්‍රමාද ගාස්තු අය කර නොතිබුණි. |
| (ඊ) | | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 422 චක්‍රලේඛය ප්‍රකාරව | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, කෘෂිකර්ම පීඨයේ කථිකාචාර්යවරුන් 04 දෙනෙක් සඳහා උපකුලපතිවරයාගේ සහ පාලක සභා අනුමැතියකින් තොරව රු.199,772 ක දීමනා ගෙවා තිබුණි. |
| (උ) | | 1990.10.10 දින අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | මාස 06 කට වරක් වාහන වල ඉන්ධන දහනය පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතු වුව ද, ආයතනය සතුව පවතින වාහන 04 ක් සම්බන්ධයෙන් එම අවශ්‍යතාව ඉටු නොකිරීම හේතුවෙන් ඉන්ධන ලීටර් 01 කට කිලෝමීටර 5.26 සිට 25.12 ලෙස විවිධ දුර ප්‍රමාණයන් යොදා ධාවන සටහන් තුළනය කර තිබුණි. |

1.2.7 **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවන ගනුදෙනු.**

---------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1978 මාර්තු 10 දිනැති අංක පිඊ/1/774/11 (බී) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි විධිවිධාන මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණද ඊට පටහැනිව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර තිබූ චක්‍රලේඛ උපදෙස් මත දෙවන හා තෙවන භාෂා ප්‍රවීණතා දීමනා ලෙස 1996 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.1,118,472 ක් ගෙවා තිබුණි.

(ආ) 2003 ජුලි 18 දිනැති අංක පිඩී/අයි/එන්එස්/ඩිඑල්/ජීඑස්/ඒ 078 දරන අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ ලිපිය පරිදි සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙනුවෙන් දායක මුදල් ගණනය කිරීමේදී අධ්‍යයන දීමනා අදාල කර නොගත යුතු වුවද, එයට පටහැනිව ගණනය කිරීම හේතුවෙන් 2001 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා රු.2,589,719 ක් වූ අධ්‍යයන දීමනා වෙනුවෙන් නිලධාරීන් දෙදෙනෙකුට රු.466,147 ක දායක මුදල් ගෙවා තිබුණි.

(ඇ) 2003 නොවැම්බර් 29 දිනැති අංක 837 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අභිබවා එළඹී 2004 නොවැම්බර් 24 දිනැති අංක 150.2.1 දරන කළමණාකරණ මණ්ඩල තීරණය පරිදි සමාලෝචිත වර්ෂය තුල බාහිර කථිකාචාර්යවරුන් හට ප්‍රතිඵල ඉක්මණින් ලබාදීම වෙනුවෙන් 10% බැගින් රු.216,050 ක ප්‍රසාද දීමනා ගෙවා තිබුණි.

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.**

---------------------------------------

2.1 **මූල්‍ය සමාලෝචනය.**

------------------------

2.1.1 **මූල්‍ය ප්‍රතිඵල.**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩකටයුතුවලින් පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු.1,770,860 ක අතිරික්තයක් වූ අතර, පුනරාවර්තන වියදම් සඳහා වූ රු.18,000,000 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු එම අතිරික්තය රු.19,770,860 ක් දක්වා වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර වූ ඌනතාවය රු.6,514,710 ක් වූ අතර, පුනරාවර්තන වියදම් සඳහා රු.14,200,000ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු එම ඌනතාවය රු.7,685,290 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි.

2.1.2 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු.**

----------------------------------

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කථිකාචාර්යවරුන් හට ආයතනයේ බාහිර දේශන පැවැත්වීම වෙනුවෙන් ගෙවීම් කර තිබුණද, විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 1.2 හා 1.3 වගන්ති පරිදි ඒ වෙනුවෙන් විශ්ව විද්‍යාලයේ බලධාරීන්ගේ පූර්ව අනුමැතිය ලබාගත් බවට සාක්ෂි ඉදිරිපත් නොවීය. එසේම ආයතන සංග්‍රහයේ IX වන පරිච්ඡේදයේ 2.3 වගන්තිය පරිදි බාහිර දේශන පැවත්වීම වෙනුවෙන් ගෙවිය යුතු රු.138,840 ක රාජ්‍ය භාගය අය කර නොතිබුණි.

**2.2 මෙහෙයුම් සමාලෝචනය.**

------------------------------

**2.2.1 කාර්ය සාධනය.**

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල පශ්චාත් උපාධි අපේක්ෂකයින් 1,651 දෙනෙක් අධ්‍යයන කටයුතුවල නිරතව සිටි අතර ඒ වෙනුවෙන් වර්ෂය තුල දරන ලද වියදමට සාපේක්ෂව ඒක ශිෂ්‍ය පිරිවැය රු.31,402 ක් වු අතර, ඉකුත් වර්ෂයේදී එම අගය රු.25,709 ක් වී තිබුණි.

(ආ) පර්යේෂණ කටයුතු සිදු කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණක් වී තිබුණද, පසුගිය වර්ෂ 5 ක කාල සීමාව තුළ පර්යේෂණ කටයුතු වෙනුවෙන් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඇ) 2008 වර්ෂය තුල එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ පර්යේෂණ කටයුත්තක් සඳහා ලබා දී තිබූ රු.7,977,611ක ප්‍රදානය වෙනුවෙන් 2009 ඔක්තෝබර් 16 වන විට අවසන් ප්‍රගති වාර්තා යැවිය යුතු වුවත්, 2010 දෙසැම්බර් මස වන විට රු.7,715,300 ක් වැය කර තිබුණද, 2011 මැයි වන විටත් පර්යේෂණ කටයුතු අවසන් වී නොතිබුණි.

(ඈ) ශිෂ්‍යයින් 4,000 ක් වෙනුවෙන් සංඛ්‍යාත හැඳුනුම්පත් පද්ධතියක් ස්ථාපිත කිරීම පිණිස රු.34,776 ක් වැය කර පුවත්පත් දැන්වීමක් පළ කර තිබූ අතර ඒ සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ 2009 මැයි 18 දින රු.1,080,460 ක මුදලකට මාස 03ක් තුළ හැඳුනුම්පත් ලබා දීමේ එකඟතාවය මත කොන්ත්‍රාත්තුවකට එළඹ තිබුණි. 2011 මැයි මස වන විට එමගින් ශිෂ්‍යයින් 1064 කට පමණක් හැඳුනුම්පත් නිකුත් කර තිබුණි. යථෝක්ත ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද වූ කාලය සඳහා අයවිය යුතු රු.1,515,525 ක දඩ මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ආයතනයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ වර්ග අඩි 1,358 ක පමණ බිම් ප්‍රමාණයක් 2001 වර්ෂයේ සිට බාහිර පුද්ගලයකු හට ආපනශාලාවක් පවත්වා ගෙන යාම සඳහා කුලී පදනම මත ගිවිසුමකින් තොරව ලබා දී තිබූ අතර, මාසික කුලී ආදායමෙන් රු.3,000ක මුදලක් නිලධාරීන්ගේ සුබසාධක සංගමය වෙත ලබා දී රු.1,000ක මාසික කුලියක් පමණක් අයතනය වෙත අයවී තිබුණි. එසේම, ආපනශාලාව සඳහා ජලය හා විදුලිය වෙනුවෙන් කිසිදු ගාස්තුවක් අයකරගෙන නොතිබුණු අතර, එහි පාවිච්චිය සඳහා ස්ථාවර වත්කම් අයිතම 37 ක්ද සපයා දී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ රු.126,450 ක් වැය කර උපකරණද ලබා දී තිබුණි.

(ඊ) ආයතනය මගින් 2005 සිට 2010 දක්වා කාලපරිච්ඡේදය තුල පශ්චාත් උපාධි පාඨමාලා සඳහා සිසුන් 2,824 ක් ලියාපදිංචි වී සිටි අතර, එම කාල සීමවා තුළ පාඨමාලාව සම්පූර්ණ නොකළ සිසුන් සංඛ්‍යාව ලියාපදිංචි සිසුන් සංඛ්‍යාවෙන් 56% ක් හෙවත් සිසුන් 1,584 ක් විය.

### 2.2.2 අරමුදල් ඌන උපයෝජනය.

---------------------------------

පහත සඳහන් කරුණු අනාවරණය විය.

(අ) වර්ෂ කීපයක සිට ඉදිරියට එන 2010 දෙසැම්බර් 31 දින වන විට නිම නොකළ පර්යේෂණ ව්‍යාපෘති 20 කට අදාළව නොදරන ලද වියදම රු.1,654,669 ක් විය.

(ආ) 2005 සහ 2006 වර්ෂවල බාහිර පර්යේෂණ වෙනුවෙන් කිසිදු වියදමක් නොදරන ලද ව්‍යාපෘති 02 කට අදාළව පිළිවෙළින් රු.20,000 ක් හා රු.581,593 ක් ද, වෙනත් ප්‍රදාන යටතේ 2005 වර්ෂයේ ලැබී තිබූ රු.300,000ක් ද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් උපයෝජනය නොකර පැවතුණි.

(ඇ) 2006 වර්ෂයේ දී කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය යටතේ පිහිටි කාබනික කෘෂිකර්ම ජාතික මධ්‍යස්ථානය (NCOA) මගින් ආයතනට ලබා දී තිබූ රු.196,000 ක් වටිනා ලැප්ටොප් පරිගණකය ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින අතර, විගණන දින වන විටත් එම වත්කම නිෂ්ක්‍රීයව පැවතුණි.

## 2.2.3 ආර්ථික නොවු ගනුදෙනු.

------------------------------

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත හා කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 1979 අංක 09 දරන නියමාවලියට අනුව කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය යටතේ කුමන හෝ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා නීතිමය ප්‍රතිපාදන සලසා නොතිබියදී, ව්‍යාපෘති කටයුතු කිරීම උදෙසා 2008 වර්ෂයේ සිට ජාතික කෘෂි කාබනික මධ්‍යස්ථානය (NCOA) සහ ශක්තීන් උත්පාදනය කිරීමේ මධ්‍යස්ථානය (CRES) නමින් මධ්‍යස්ථාන 02 ක් පිහිටුවා තිබුණි.

(ආ) ශක්තීන් උත්පාදනය කිරීමේ මධ්‍යස්ථානය සඳහා පාලක සභා සහ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියකින් තොරව රු.800,000 ක මුදලක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් දෙදෙනෙකු හට බාහිර දේශන ගාස්තු වෙනුවෙන් වැයකර තබුණි. තවද පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු ඉහත මධ්‍යස්ථානයන්හි අධ්‍යක්ෂකවරු වශයෙන් බඳවා ගෙන අධ්‍යක්ෂ දීමනා ලෙස රු.1,126,000 ක් ගෙවා තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ iii පරිච්ඡේදයේ 1.2.8 ප්‍රකාරව කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂක හට පාලක මණ්ඩලය විසින් අදාල බලතල පවරා නොමැති විටෙක විදේශ ප්‍රදානයක් මඟින් පවත්වා ගෙන යනු ලබන Crossing Boundries ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ කටයුතු සඳහා බාහිර පුද්ගලයකු බඳවා ගෙන ඔහුට මාසිකව රු.80,000 ක් බැගින් 2010 අප්‍රේල් මස සිට දෙසැම්බර් මස දක්වා රු.720,000 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

## 2.2.4 හඳුනා ගන්නා ලද පාඩු.

----------------------------

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පර්යේෂණ ව්‍යාපෘති සඳහා වු ගිවිසුමේ අංක 7(iii) පරිදි පර්යේෂණ කටයුතු අවසන් වු පසු කිසියම් ව්‍යාපෘතියකට අයත් ස්ථාවර වත්කම් ඊට අදාල ආයතනයට පැවරිය යුතු වුවද, පර්යේෂණ කටයුතු නිම කරන ලද ව්‍යාපෘති 04 කට අදාල වටිනාකම රු.1,415,374ක්වූ ස්ථාවර වත්කම් 2010 දෙසැම්බර් වන විටත් ආයතනය වෙත පවරා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 2.2.5 කාර්ය මණ්ඩලය

------------------

අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 09 ක් වූ අතර, එම පුරප්පාඩු තනතුරු පිරවීමට කටයුතු නොකර, සමාලෝචිත වර්ෂය තුළ බාහිර දේශන ගාස්තු රු.13,883,972 ක් ගෙවා තිබුණි.

## 2.2.6 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර් සැලැස්ම.

----------------------------------------------------

ආයතනය විසින් සංයුක්ත සැලැස්මක් හා වාර්ෂික ක්‍රියාකාර් සැලැස්මක් පිළියෙල කර කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර, රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2007 දෙසැම්බර් 18 දිනැති හා අංක පීඊඩී/47 චක්‍රලේඛය පරිදි සැම මූල්‍ය වර්ෂයක් ආරම්භයේදීම අවම වශයෙන් දින 15 කට පෙර යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මක් පිළියෙල  කළයුතු වුව ද, සමාලෝචිත වර්ෂය සඳහා එම සැලසුම් පිළියෙල  කර නොතිබුණි.

## 2.2.7 අය වැය ලේඛනමය පාලනය.

-----------------------------------

අය වැය ලේඛනයේ ආදායම් හා වියදම් සහ එහි තථ්‍ය ආදායම් හා වියදම් පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

(අ) අය විෂයයන් 15 කට අදාළව ඇස්තමේන්තුගත ආදායම ඉක්මවීම රු. 18,490,001 ක් වූ අතර එහි ප්‍රතිශතය 12% සිට 275% දක්වා පරාසයක පැවතුණි. අය විෂයයන් 02 කට අදාළව ඇස්තමේන්තුගත ආදායම් ඌනතාවය රු. 133,995 ක් වූ අතර එහි ප්‍රතිශතය 21% සිට 64% ක් දක්වා පරාසයක පැවතුණි. මේ හේතුවෙන්  අයවැය ලේඛනය මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව, වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිවත්, සම්පූර්ණවත්, පිළියෙළ කිරීමට ගණන් දීමේ නිලධාරීන්ගේ වගකීම වුවද වැය විෂයයන් 24 කට අදාළව  16%  සිට 100% දක්වා වූ රු.20,963,328 ක ඉතිරියක් සිදු වී තිබූ අතර වැය විෂයයන් 07 කට අදාළව 16% සිට 129% ක් දක්වා රු.1,328,687 ක ඇස්තමේන්තු ඉක්මවීමක් සිදු වී තිබුණි.

3. **පද්ධති හා පාලන.**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා අධ්‍යක්ෂවරයා වෙත වරින්වර මාගේ වාර්තා මගින් පෙන්වා දී ඇත. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම් ගිණුම් තැබීම

(ඇ) අත්තිකාරම් පියවීම

(ඈ) මිල දී ගැනීම්

(ඉ) පර්යේෂණ හා ප්‍රදානයන් සම්බන්ධ කටයුතු

(ඊ) භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

(උ) කෙටිකාලීන පාඨමාලා පැවැත්වීම

(ඌ) අයවැය පාලනය